DOI: 10.31357/fhssmst.2015.00105

# දිවිනැගුම ව්‍යාපෘතිය මඟින් සිදුවන සමාජ බලපෑම පිළිබඳ අධ්‍යයනය

## (බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය හා ධීවර ප්‍රජා ඇසුරෙන්)

කාමරන්ගාහැන්නදිගේ රෝසරි ඉරේෂා ප්‍රනාන්දු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
17 NOV 2015
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

උපදිෂ්ඨ ශාස්ත්‍රපති සමාජ විද්‍යා පර්යේෂණය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

2014

## කර්තෘත්ව සහතිකය

මා විසින් සම්පාදනය කරන ලද දිවි නැගුම ව්‍යාපෘතියෙන් වන සමාජ බලපෑම ( බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය හා ධීවර ප්‍රජා ඇසුරෙන්) යන පර්යේෂණ නිබන්ධනයෙහි ඇතුලත් කිසිවක් වෙනත් විශ්ව විද්‍යාලයක හෝ එවැනි ආයතනයක කිසිදු උපාධි හෝ වෙනත් පශ්චාද් උපාධි අවශ්‍යතාවයක් සඳහා මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ ඉදිරිපත් කර නොමැති බවත් මෙය මා විසින්ම රචනා කරන ලද්දක් බවත් මෙහි ඇතුලත් වෙනත් පර්යේෂණ හා පොත්පත් වලින් ගනු ලැබූ දත්ත හෝ තොරතුරු කිසිවක් නිවැරදි උපුටා ගැනීමකින් හෝ සඳහනකින් හෝ තොරව භාවිතා කර නොමැති බවත් සහතික කරමි.

..............................

කේ. ආර්.අයි . ප්‍රනාන්දු

## උපදේශකගේ සහතිකය

මාගේ උපදේශකත්වය හා මගපෙන්වීම යටතේ සිදු කරන ලද මෙම පර්යේෂණ නිබන්ධනය පර්යේෂකයාගේ උනන්දුව හා ඇයට හැකි උපරිමයෙන් සිදු කරන ලද බවත් මා දන්නා තරමින් මෙය වෙනත් කිසිදු උපාධි අවශ්‍යතාවයක් සඳහා ඉදිරිපත් කර නොමැති බවත් සහතික කරමි. තවද 2015.10.15 දින පැවති වාචික පරීක්ෂණයේදී පෙන්වා දෙන ලද සංශෝධනද මෙම පර්යේෂණ නිබන්ධනයට ඇතුලත් කර ඇති බව වැඩිදුරටත් සහතික කරමි.

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

නුගේගොඩ

2015.11.05

## පෙරවදන

දකුණු ආසියාතික මධ්‍යම පාන්තික රටක් ලෙස ශ්‍රී ලංකාව තුළ පවතින දිළිඳුම ඉවත් කිරීම සඳහා නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති බව නිදහසින් පසු ගත වූ කාලය තුළ දැක ගත හැකිය. මෑත කාලීනව ක්‍රියාත්මක වූ එවැනි ව්‍යාපෘති අතර ආහාර මුද්දර සළාකය ජන සවිය, සමෘද්ධි හා වර්තමානයෙහි දිවිනැගුම ව්‍යාපෘතිය ප්‍රමුඛකොට සැළකිය හැකිය. මෙම දිවිනැගුම ව්‍යාපෘතිය ඊට පෙර ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් හා සැළකීමේදී විශේෂයෙන් වැදගත් වන්නේ එමගින් පුද්ගලයෙකු පමනක් නොව ඔහු අයත් පවුලම ඉලක්ක කර ගනිමින් පවුලේ ආර්ථිකය නැංවීමත් මූලික කොටගෙන ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන බැවිනි. ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම මගින් සමාජ සාධාරනත්වය සපිරි තිරසාර සංවර්ධනයට මග පෙන්වන ව්‍යාපෘතියක් ලෙස මෙම දිවිනැගුම ව්‍යාපෘතිය දිවයින තුළ ක්‍රියාත්මක කර තිබේ. එහි ප්‍රතිලාභී පවුල් පමණක් නොව අනෙකුත් පවුල්ද ඊට ආකර්ෂණය කර ගැනීමට හැකි අයුරින් සමාජ සත්කාරක සේවා හා සමාජ සංවර්ධන කාර්යයන්ද මෙම ව්‍යාපෘති යාන්ත්‍රණයට ඇතුලත් වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩි ජන නියෝජනයක් පවතින ග්‍රාමීය හා ධීවර ප්‍රජාවන් ඇසුරෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී තිබෙන්නේ කෙලෙස ද යන්න හඳුනා ගැනීමටත් එමඟින් ව්‍යාපෘතියේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට කුමන අනුවර්තනය සිදුවිය යුතු ද යන්නත් අවබෝධ කර ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදුකර තිබේ. මෙහිදී තෝරාගත් නියැදියක් තුළින් ප්‍රශ්නාවලියක් ඇසුරෙන් පවුල් ඒකක වලින් හා ව්‍යාපෘති නියමු නිලධාරීගෙන් තොරතුරු ලබාගෙන ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඇත. ඒ මගින් ජාතික ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන දිවිනැගුම ව්‍යාපෘතිය පිළිබඳව අධ්‍යයනයක් සිදුකර එම තොරතුරු වන්නේ ව්‍යාපෘතියේ ගුණාත්මක බව ඉහළ නැංවීමටත්, එමගින් උත්පාදනය වී ඇති ගැටළු අවම කර ගැනීමටත් මාර්ගෝපදේශයක් හඳුනා ගැනීමට අදාල කරගත හැකි වේ යැයි නිගමනය කළ හැකිය.

## පිදුම

ජීවිතයේ භය හතර කියාදී

පාසැල වෙත මා ගෙන ගිය දෙමාපියන්ටත්

එතැන් සිට මේ දක්වා

විවිධාකාරයෙන් මා වෙත ශිල්ප කියා දුන්

සියළුම ගුරු පියවරු හා ගුරු මෑණිවරුන්ටත්

යහපත් සමාජයක් ගොඩනැගීමට උර දෙන සියළුදෙනාටත්

**ආදරයෙන් හා ගෞරවයෙන් පුදමි**

# තුති පිදුම

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්යතුමාටත්

මෙම නිබන්ධනය සඳහා උපදේශනය ලබා දුන් ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර මහතාටත්

බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර සැලසුම් අධ්‍යක්ෂක තුමිය ඇතුළු කාර්යමණ්ඩලයටත්

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන්ටත්

සමෘද්ධි නිලධාරීන් හා කෘෂිපර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ටත්

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ටත්

ආගමික ස්ථානවල ගරුතර ස්වාමින්වහන්සේ ඇතුළු පූජක සැමටත්

තොරතුරු ලබාදෙමින් පර්යේෂණයට සහය දුන් ප්‍රතිලාභී පවුල්වලටත්

**මාගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරමි**

පටුන පිටු අංකය


පෙරවදන

පිදුම

තුති පිදුම

පටුන

පළමු පරිච්ඡේදය හැඳින්වීම

1:1. හැඳින්වීම 01 - 03

1:2. පර්යේෂණයේ වැදගත්කම 04 - 05

1:3. පර්යේෂණයේ අරමුණු

1:3:1. ප්‍රධාන අරමුණු 05 - 06

1:3:2. උප අරමුණු 07

1:4. පර්යේෂණ ගැටළුව 07

1:4:1. උපන්‍යාසය 07 - 08

1:5. අධ්‍යයන ප්‍රදේශය 08 - 09

1:6. මූලාශ්‍ර 09 - 12

1:7. නියැඳිය තෝරා ගැනීම 12 - 13

1:8. අධ්‍යයනය සඳහා තෝරා ගත් ග්‍රාමසේවා වසම් 04

1:9. දත්ත රැස් කිරීමේ ක්‍රම 15 - 16

1:9:1. දත්ත විශ්ලේෂණය 16 - 19

1:10.පර්යේෂණයේ සීමාවන් 19 - 20

1:11. පර්යේෂණයේදී මුහුණ දුන් ගැටළු 20 - 21

දෙවන පරිච්ජේදය සංකල්ප නිර්වචනය කිරීම හා න්‍යායන් විග්‍රහ කිරීම

2:1. දිළිඳුකම පිළිබඳ නිර්වචනය හා දිළිඳුකම හඳුනා ගැනීම 22 - 29

2:2. දිළිඳුභාවයේ ලක්ෂණ 30

2:3. දිළිඳුබවේ මිණුම් දර්ශක 30 - 31

2:4. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි බලපාන ආර්ථික හා සමාජීය සාධක 32 - 33

තෙවන පරිච්ජේදය

සංවර්ධන සංකල්ප හා සම්බන්ධ දිවි නැගුම

3:1. සංවර්ධනය නිර්වචනය කිරීම 34 - 38

3:2. සංවර්ධන ව්‍යාපෘතියක් යනු කුමක්ද 39 - 40

3:3 ප්‍රජා සහභාගිත්වය දිවිනැගුම ව්‍යාපෘතිය 40 - 41

3:4. සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය 42 - 46

සිව්වන පරිච්ජේදය

දිවි නැගුම ජාතික වැඩසටහන යනු කුමක්ද

4:1. හැඳින්වීම 47

4:1:1. දිවිනැගුම ව්‍යාපෘතියේ පරමාර්ථ හා ක්‍රියාකාරීත්වය 47 - 51

4:2.දිවිනැගුම ව්‍යාපෘතියට පෙර මෙරට ක්‍රියාත්මක වූ වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන් 49 - 52

4:2:1. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටු දැකීමේ වැඩසටහන් 53 - 57

4:3. ජාතික ව්‍යාපාරයක් ලෙස දිවි නැගුම ව්‍යාපෘතිය හඳුනා ගැනීම 57 - 59

4:4. අධ්‍යයනය සඳහා ග්‍රාමීය හා ධීවර ප්‍රජාව යොදාගැනීමේ වැගදත්කම 60 - 62

පස්වන පරිච්ඡේදය

පර්යේෂණයට යොදා ගන්නා ප්‍රදේශයේ භෞතික ආර්ථික හා සමාජ පසුබිම

5:1. හැඳින්වීම 63

5:2. ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් තත්ත්වය හඳුනා ගැනීම 63 - 64

5:3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භෞතික පිහිටීම 65

5:4. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ජන සංයුතිය 65 - 68

5:5. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කර්මාන්ත 68 - 71

5:6. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ යටිතල පහසුකම් 71 - 72

හයවන පරිච්ඡේදය

දිවි නැගුම ව්‍යාපෘතිය මගින් ඇතිවූ සමාජ බලපෑම

6:1. හැඳින්වීම 73

6:2. ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය 73

6:2:1 පුද්ගල ජීවනෝපාය සංවර්ධනය 74 - 76

6:2:2.කර්මාන්ත ඇති කිරීම මගින් ජීවනෝපාය සංවර්ධනය 76 - 78

6:3. ආහාර සුරක්ෂිතතාවය 79

6:3:1. ගෙවතුවගාව 79 - 80

6:3:2. සත්ව නිෂ්පාදන 82

6:4. සෞඛ්‍ය හා අධ්‍යාපනය 83- 84

6:5. ආකල්ප වෙනසක් සඳහා ව්‍යාපෘතියේ බලපෑම 85

6:6.සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම 86 - 90

6:7.සමාජ සබඳතා හා සංස්කෘතිය ගොඩනැගීම 90 - 94

6:8 ව්‍යාපෘතියේ ප්‍රජා සංවිධානයන් තුළින් සමාජ ජීවිතයට කර ඇති බලපෑම 94 -95

6:9 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන් භාවිතා කළ උපක්‍රම 95 -99

6:10 ව්‍යාපෘතිය හේතුවෙන් උද්ගත ගැටළු 99

6:10:1 ප්‍රතිලාභී පවුල් මුහුණ දී ඇති ගැටළු 100

6:10:2 නියමු නිලධාරීන් මුහුණ දී ඇති ගැටළු 101

හත්වන පරිච්ඡේදය

නිගමන හා යෝජනා

7:1. නිගමන 102 - 107

7:2. යෝජනා 107

7:2:1. දිවි නැගුම ව්‍යාපෘතියේ සිදුවිය යුතු අනුවර්තන 107 - 108

08. ආශ්‍රය ග්‍රන්ථ 109 - 113

09. පර්යේෂණය සඳහා යොදා ගත් ප්‍රශ්ණාවලිය 114 - 123

ප්‍රස්ථාර නාමාවලිය | පිටු අංකය


5:4:1 ප්‍රස්ථාරය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජාතීන් අනුව විවිධත්වය 66

5:4:2 ප්‍රස්ථාරය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආගම අනුව විවිධත්වය 66

5:4:3 ප්‍රස්ථාරය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ත්‍රී පුරුෂ අනුව විවිධත්වය 67

6:2:1:1 ප්‍රස්ථාරය

බීජ පැළ නිකුත් කිරීම් 75

6:2:1:2 ප්‍රස්ථාරය

පශු හා ධීවර අංශයේ නිකුත් කිරීම් 76

6:2:2:1 ප්‍රස්ථාරය

කර්මාන්තවල නියුක්තිය 78

6:2:2:2 ප්‍රස්ථාරය

කර්මාන්තවල නියුක්තියේ ස්වභාවය 78

6:3:1:1 ප්‍රස්ථාරය

ගෙවතු වගා තරඟ සහභාගිත්වය 81

6:3:1:2 ප්‍රස්ථාරය

ගෙවතු වගාව සඳහා පවුලේ සහභාගිත්වය 81

6:3:2 ප්‍රස්ථාරය

සත්ව නිෂ්පාදන ප්‍රයෝජනයට ගැනීම 82

6:5 ප්‍රස්ථාරය

ව්‍යාපෘතිය සඳහා ප්‍රජා දායකත්වය 86

6:6:1 ප්‍රස්ථාරය

ජීවන වියදම කෙරෙහි වූ බලපෑම 87

6:6:2 ප්‍රස්ථාරය

තිරසර සංවර්ධනය පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය 89

6:6:3 ප්‍රස්ථාරය

සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභී ප්‍රජාවන්ගේ දායකත්වය 89

6:7 ප්‍රස්ථාරය

සමාජ සබඳතා ගොඩනැගීම 91

| වගු නාමාවලිය | පිටු අංකය |
| --- | --- |
| 6:2:1:1 වගුව | |
| බීජ පැළ නිකුත් කිරීම් | 74 |
| 6:2:1:2 වගුව | |
| පශු හා ධීවර අංශයේ නිකුත් කිරීම් | 75 |
| 6:2:2:1 වගුව | |
| කර්මාන්තවල නියුක්තිය | 77 |
| 6:4:1 වගුව | |
| සංරක්ෂණීය සායනික සේවාව | 84 |
| 6:4:2 වගුව | |
| ප්‍රතිශක්තීකරණ තොරතුරු | 84 |
| 6:6:1 වගුව | |
| ක්‍රියාත්මක කර ඇති සංවර්ධන ව්‍යාපෘති | 90 |
| 6:7:1 වගුව | |
| වෙළඳාම තුළ සබඳතා ගොඩනැගීම | 92 |
| 6:7:2 වගුව | |
| දිවිනැගුම පොළ සඳහා ප්‍රතිලාභී පවුල්වල දායකත්වය | 92 |

6:7:3 වගුව

ප්‍රතිලාභී පවුල්වල පුහුණු අවස්ථා 93

6:9:2 වගුව

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කළ උපක්‍රම 97

6:9:3 වගුව

ජංගම සේවයට පැමිණි ප්‍රතිලාභීන් 98

6:9:4 වගුව

දිවි නැගුම පරමාර්ථ පිළිබඳ ප්‍රජාවගේ ආකල්ප 99

සාරාංශය

දරිද්‍රතාවය ජය ගැනීමත් සමඟින් සමාජ සාධාරණත්වය සපිරි ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා ඇති දිවිනැගුම ව්‍යාපෘතිය සමාජයේ කුඩාම ඒකකය වන පවුල මූලික කරගත් සංවර්ධන ව්‍යාපෘතියකි. එය ජාතික ව්‍යාපාරයක් ලෙස රජය මූලික කරගනිමින් ක්‍රියාත්මක වී ඇත. මෙහිදී මෙම දිවිනැගුම වැඩසටහනේ අරමුණු හා ඉලක්ක අනුව ඊට දායකත්වය සපයන සමාජයට ඇතිවන ප්‍රතිවිපාක එම සමාජයේ පැවැත්මට හා ව්‍යුහයටත් සමාජ කෘත්‍යයටත් කරන ලද බලපෑම සමාජ විද්‍යාත්මක න්‍යායයන් හා සංකල්ප ඔස්සේ හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය මගින් උත්සාහ දරණ ලදි. බහුතරය දරිද්‍රතාවයෙන් පෙළෙන ලෝකයක නව ආර්ථික සංවර්ධන යුගයක් කරා පිවිසීමේ දී දුප්පතුන්ගේ මූලික අවශ්‍යතා පමණත් සපුරාලීම ප්‍රමාණවත් නොවේ. ඔවුන්ගේ භෞතික අවශ්‍යතා පමණක් නොව සාමාජීය අවශ්‍යතාද සපුරාලීම වැදගත් බව සංවර්ධනය පිළිබඳ වූ සංකල්පය ඔස්සේ විස්තර කර ඇත. තවද දිළිඳුකම පිළිබඳ නිර්වචන ඔස්සේ දිළිඳුකම අර්ථකථනය කිරීමටත් එහි නොයෙක් ප්‍රවණතා හඳුනා ගැනීමටත් සමාජ විද්‍යාත්මක සංකල්ප ඔස්සේ උත්සාහ දරා ඇත.

මේ අනුව මෙරට පවතින දුප්පත්කම යම් තරමකට හෝ අප අතරින් ඉවත් කිරීමට රටේ නීතිය ආයතන නිලධාරීන් පොදු සමාජය අතින් විය යුතු කාර්යය භාරයක් පවතී. එමෙන්ම මෙම ව්‍යාපෘතියට දායකත්වය සපයන ප්‍රතිලාභීන් විසින් ද සිදු කළ යුතු වගකීම් හා කාර්යය සමුදායක් ඇත. දිවිනැගුම ව්‍යාපෘතියේ පරමාර්ථය වන සමාජ සංවර්ධනය පිළිබඳවත් සමාජ විද්‍යාත්මක න්‍යායන් ඔස්සේ මෙමඟින් විග්‍රහ කර ඇත. සංවර්ධනය යන්නෙන් පළ කෙරෙන ඉතා දළ අර්ථය මිනිසාගේ සුභසාධනය පිළිබඳ ප්‍රගතිය ලෙස සැළකුවහොත් මිනිසා වසර දස දහස් ගණනක් තුළම සිය සුභසාධනය පිළිබඳ ප්‍රගති මාර්ගයක යෙදී සිටිමින් නියැලී ඇත්තේ සංවර්ධන කාර්යයකම බව මොනවට පැහැදිලිය. සමාජීය වශයෙන් ගත් කළ ආර්ථික සංවර්ධනය මත අනෙකුත් සමාජීය අංශයන්ද සංවර්ධනය වීම දැකගත හැකිය.

ශ්‍රී ලංකාවේ මෙලෙස දරිද්‍රතාව පිටු දැක සමාජ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වැඩසටහන් බොහෝමයක් පැවති අතර. ඒවා විවිධ යුගවලදී ක්‍රියාත්මක වූ ආකාරයත්, එමගින් සිදුකරනු

ලැබූ සාමාජීය වෙනසක් කෙරෙහිද මෙම අධ්‍යයනයෙන් අවධානය යොමු කර ඇත. ඒ අනුව සාමාජීය වශයෙන් දිළිදුකම තුරන් කිරීමේ කාර්යයේදී මෙම ව්‍යාපෘතිය සුවිශේෂී වන්නේ කෙසේද යන්න හඳුනා ගැනීමට මෙමඟින් උත්සාහ දරා ඇත.

දිවි නැගුම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත පරිදි දිළිදුකම තුරන් කිරීම තුළින් සමාජයට ළඟා කර ගත හැකි යහපත් බලපෑම් යටතේ දුප්පතුන් ආර්ථිකව සවිබල ගැන්වීමත්, එමගින් පීඩනයෙන් තොරව ජීවත්වීමට හැකියාව ලබා ගැනීමත් වැදගත් වේ. එලෙස සිත සැහැල්ලු වීමෙන් නිරෝගීවීමට ඇති ඉඩ වැඩිය. නිරෝගීකම නිසාත්, හොඳ සමාජ තත්ත්වයක් පැවතීම නිසාත්, පුද්ගලයෙකුගේ යහපත් හැසිරීම ඇතිවේ. ඒ නිසා, ඔහුගෙන් නිතරම සමාජයට ලැබෙන්නේ සුභවාදී පණිවිඩයකි. පුද්ගලයන් තුල වෙනසක් නොවී පොදු සමාජයේ වෙනසක් සිදු නොවේ. මෙම සංකල්පය පෙරදැරිව දිවි නැගුම ව්‍යාපෘතිය දිවයිනම ආවරණය වන අයුරින් ක්‍රියාත්මක කර තිබේ. එකී සංකල්පය බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධ්‍යයනය සඳහා තෝරාගත් ග්‍රාමීය හා ධීවර ප්‍රජා ඇසුරින් කොතෙක් දුරට සාක්ෂාත් වී තිබේද යන්න පර්යේෂණය තුළින් හඳුනාගෙන ඇත.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ග්‍රාමීය හා ධීවර ප්‍රජාවන්ගේ සමාජීය වැදගත්කම, ධර්මතා, අගනාකම් සැළකිල්ලට ගෙන දිවිනැගුම ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක වී ඇත්තේ කෙසේද, තව දුරටත් එය කෙසේ විය යුතුද යන්න හඳුනා ගැනීමට උත්සාහ දරා ඇති අතර, එය මෙම ව්‍යාපෘතියේ සඵලදායී බව ඉහළ නැංවීමට වැදගත්කොට සැළකිය හැකිය.